## අසමසම ක්‍රිකට් සැණකෙළිය

## අසමසම නාලිකාව තුළින් ඔබේ රසවින්දනයට..!!

ලොව පුරා සිටින මිලියන සංඛ්‍යාත ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන් නොඉවසිල්ලෙන් බලා සිටි අති උත්කර්ෂවත් සැණකෙළිය.. ජාත්‍යන්තර විස්සයි විස්ස ලෝක කුසලාන තරඟාවලිය.. මේ මස 16 වන දින සිට නොවැම්බර් මස 13 වෙනිදා දක්වා ඕස්ට්‍රේලියාවේදී පැවැත්වේ.

මෙවර ශ්‍රී ලංකා කණ්ඩායම සුපිරි 12 දෙනාගේ වටයට තේරීපත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ වටයට මුහුණ දෙන අතර එහිදී නැමීබියාව සමඟින් ඔක්තෝම්බර් 16 වෙනිදාත්, UAE සමඟින් ඔක්තෝම්බර් 18 වෙනිදාත්, නෙදර්ලන්තය සමඟින් ඔක්තෝම්බර් 20 වෙනිදාත් තරඟවදිනු ඇත.එම අදියරේ පළමු ස්ථානය හිමිකර ගතහොත් ශ්‍රී ලංකාව සුපිරි 12 දෙනාගේ වටයේදී ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, එංගලන්තය සහ ඇෆ්ගනිස්ථානය සමඟින් A කණ්ඩායමට තේරීපත් වනවා.

ආසියානු කුසලානය දිනාගැනීමත් සමඟ ප්‍රබල මානසිකත්වයකින් පසුවන ශ්‍රී ලංකා කණ්ඩායම මෙවර ලෝක කුසලානයේදී පෙරළියක් සිදුකරනු ඇතැයි බොහෝ විචාරකයින් මත පලකර තිබේ.මෙම පෙරළිය පන්දුවෙන් පන්දුවට ලාංකික ප්‍රේක්ෂකයන්ට සමීප කරන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විද්‍යුත් නාළිකාවක් වන සිරස ටීවී තුළිනි.

ලෝක කුසලාන විකාශන අයිතිය ලබාගැනීම සම්බන්ධයෙන් කැපිටල් මහරාජා සමූහ ව්‍යාපාරයේ සිරස මාධ්‍ය ජාලයේ විධායක සමූහ අධ්‍යක්ෂක ශෙවාන් ඩැනියල් මහතා පැවසුවේ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කැපවූ ඉතිහාසයක් ඇති ආයතනයක් ලෙස, කැපිටල් මහරාජා සමූහ ව්‍යාපාරය මෙවර ලෝක කුසලානයේ ආස්වාදය ලාංකික ප්‍රේක්ශකයා වෙත සිරස ටීවී හරහා සමීප කරවීමට හැකිවීම පිලිබඳව ඉමහත් සතුටට පත් වන බවයි.

ශ්‍රී ලංකාවේ දැවැන්තම මාධ්‍ය ජාලය ලෙස මෙම අවස්ථාව ලැබීම පිලිබඳව තෘප්තිමත් වන බවත්, ශ්‍රී ලංකාව ඇතුළුව කරට කර තරග වදින කණ්ඩායම් තුලින් මෙම තරගාවලිය පුරාවට උණුසුම් තරඟකාරී බවක් දැක ගැනීමට හැකි වනු ඇති බවත් MTV චැනල් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරි සුසාර දිනාල් මහතා පැවසුවා.

සිරස ටීවී මෙවර ලෝක කුසලානය සජීවීව විකාශනය කරන්නේ නවීන තාක්ෂණයද මුසු කරමිනි. ක්‍රිකට් වංශකතාව අලුත් කරන්නට සැරසෙන සිංහ පෝතකයින්ගේ ජයග්‍රාහී ගමන මග, අත් නොහැර රසවිඳින්න ඔබත් සිරස ටීවී සමඟින් ඔක්තෝම්බර් 16 වැනිදා සිට එකතුවන්න.

**T20 ලෝක කුසලාන තරඟ කාල සටහන - 2022**

| දිනය | වේලාව | තරඟය |
|---|---|---|
| **ඔක්.16** | **පෙ.ව 9:30** | **ශ්‍රී ලංකාව සහ නැමීබියාව** |
| ඔක්.16 | ප.ව 1:30 | UAE සහ නෙදර්ලන්තය |
| ඔක්.17 | පෙ.ව 9:30 | බ.ඉ.කොදෙව් සහ ස්කොට්ලන්තය |
| ඔක්.17 | ප.ව 1:30 | සිම්බාබ්වේ සහ අයර්ලන්තය |
| ඔක්.18 | පෙ.ව 9:30 | නැමීබියාව සහ නෙදර්ලන්තය |
| **ඔක්.18** | **ප.ව 1:30** | **ශ්‍රී ලංකාව සහ UAE** |
| ඔක්.19 | පෙ.ව 9:30 | ස්කොට්ලන්තය සහ අයර්ලන්තය |
| ඔක්.19 | ප.ව 1:30 | බ.ඉ.කොදෙව් සහ සිම්බාබ්වේ |
| **ඔක්.20** | **පෙ.ව 9:30** | **ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය** |
| ඔක්.20 | ප.ව 1:30 | නැමීබියාව සහ UAE |
| ඔක්.21 | පෙ.ව 9:30 | අයර්ලන්තය සහ බ.ඉ.කොදෙව් |
| ඔක්.21 | ප.ව 1:30 | ස්කොට්ලන්තය සහ සිම්බාබ්වේ |
| ඔක්.22 | ප.ව 12:30 | ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය |
| ඔක්.22 | ප.ව 4:30 | එංගලන්තය සහ ඇෆ්ගනිස්තානය |
| ඔක්.23 | පෙ.ව 9:30 | A කණ්ඩායමේ පළමු සහ B කණ්ඩායමේ දෙවැනි |
| ඔක්.23 | ප.ව 1:30 | ඉන්දියාව සහ පාකිස්තානය |
| ඔක්.24 | පෙ.ව 9:30 | බංගලාදේශය සහ A කණ්ඩායමේ දෙවැනි |
| ඔක්.24 | ප.ව 1:30 | දකුණු අප්‍රිකාව සහ B කණ්ඩායමේ පළමු |
| ඔක්.25 | ප.ව 4:30 | ඕස්ට්‍රේලියාව සහ A කණ්ඩායමේ පළමු |
| ඔක්.26 | පෙ.ව 9:30 | එංගලන්තය සහ B කණ්ඩායමේ දෙවැනි |
| ඔක්.26 | ප.ව 1:30 | නවසීලන්තය සහ ඇෆ්ගනිස්තානය |
| ඔක්.27 | පෙ.ව 8:30 | දකුණු අප්‍රිකාව සහ බංගලාදේශය |
| ඔක්.27 | ප.ව 12:30 | ඉන්දියාව සහ A කණ්ඩායමේ දෙවැනි |
| ඔක්.27 | ප.ව 4:30 | පාකිස්තානය සහ B කණ්ඩායමේ පළමු |
| ඔක්.28 | පෙ.ව 9:30 | ඇෆ්ගනිස්තානය සහ B කණ්ඩායමේ දෙවැනි |
| ඔක්.28 | ප.ව 1:30 | ඕස්ට්‍රේලියාව සහ එංගලන්තය |
| ඔක්.29 | ප.ව 1:30 | නවසීලන්තය සහ A කණ්ඩායමේ පළමු |
| ඔක්.30 | පෙ.ව 8:30 | බංගලාදේශය සහ B කණ්ඩායමේ පළමු |
| ඔක්.30 | ප.ව 12:30 | පාකිස්තානය සහ A කණ්ඩායමේ දෙවැනි |
| ඔක්.30 | ප.ව 4:30 | ඉන්දියාව සහ දකුණු අප්‍රිකාව |
| ඔක්.31 | ප.ව 1:30 | ඕස්ට්‍රේලියාව සහ B කණ්ඩායමේ දෙවැනි |
| නොවැ.01 | පෙ.ව 9:30 | ඇෆ්ගනිස්තානය සහ A කණ්ඩායමේ පළමු |
| නොවැ.01 | ප.ව 1:30 | එංගලන්තය සහ නවසීලන්තය |
| නොවැ.02 | පෙ.ව 9:30 | B කණ්ඩායමේ පළමු සහ A කණ්ඩායමේ දෙවැනි |
| නොවැ.02 | ප.ව 1:30 | ඉන්දියාව සහ බංගලාදේශය |
| නොවැ.03 | ප.ව 1:30 | පාකිස්තානය සහ දකුණු අප්‍රිකාව |
| නොවැ.04 | පෙ.ව 9:30 | නවසීලන්තය සහ B කණ්ඩායමේ දෙවැනි |
| නොවැ.04 | ප.ව 1:30 | ඕස්ට්‍රේලියාව සහ ඇෆ්ගනිස්තානය |
| නොවැ.05 | ප.ව 1:30 | එංගලන්තය සහ A කණ්ඩායමේ පළමු |
| නොවැ.06 | පෙ.ව 5:30 | දකුණු අප්‍රිකාව සහ A කණ්ඩායමේ දෙවැනි |
| නොවැ.06 | පෙ.ව 9:30 | පාකිස්තානය සහ බංගලාදේශය |
| නොවැ.06 | ප.ව 1:30 | ඉන්දියාව සහ B කණ්ඩායමේ පළමු |
| නොවැ.09 | ප.ව 1:30 | අවසන් පූර්ව තරඟය - 01 |
| නොවැ.10 | ප.ව 1:30 | අවසන් පූර්ව තරඟය - 02 |
| නොවැ.13 | ප.ව 1:30 | අවසන් මහා තරඟය |